කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය**

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**2023 මැයි මස 12 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2023 මැයි මස 11 දින මධ්‍යහන 12.00 ට නිකුත්කරන ලදි.**

බස්නාහිර, සබරගමුව, මධ්‍යම, වයඹ සහ දකුණු පළාත්වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. බස්නාහිර, සබරගමුව සහ වයඹ පළාත්වලත් මහනුවර, නුවරඑළිය, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථාන වලට **මි.මී. 75ක පමණ** තරමක් තද වැසි ද ඇතිවිය හැක.

උතුරු සහ උතුරුමැද පළාත්වල වැසි වාර කිහිපයක් ඇතිවේ.

ඌව සහ නැගෙනහිර පළාත්වල විශේෂයෙන් සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති විය හැක.

බස්නාහිර සහ දකුණු වෙරළබඩ ප්‍රදේශවලත් මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම්වලත් විටින් විට හමන **පැ.කි.මී. (40-45)** ක පමණ තද සුළං ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 12 May 2023
## Issued at 12.00 noon on 11 May 2023

Showers or thundershowers will occur at times in Western, Sabaragamuwa, Central, North-Western and Southern provinces. Fairly heavy showers **about 75 mm** are likely at some places in Western, Sabaragamuwa and North-Western provinces and in Kandy, Nuwara-Eliya, Galle and Matara districts.

Several spells of showers will occur in the Northern and North-Central provinces.

Showers or thundershowers will occur at several places in Uva and Eastern provinces particularly during the afternoon or night.

Strong winds about (**40-45) kmph** can be expected at times over western and southern coastal areas and along the western slopes of the central hills.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2023 මැයි මස 11 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

**ගිනිකොණදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති ගැඹුරු පීඩන අවපාතය, “මොචා” සුළි කුණාටුව දක්වා වර්ධනය වී අද දින (මැයි 11) පැය 08:30 වනවිට 11.4⁰N සහ 88.0⁰E ආසන්නයේ කේන්ද්‍රගත වී පැවතිණි. එම පද්ධතිය උතුරට බරව වයඹ දෙසට ගමන් කරමින් අද මධ්‍යම රාත්‍රියේදී පමණ චණ්ඩ සුළි කුණාටුවක් දක්වා ක්‍රමයෙන් වර්ධනය වීමට බොහෝ දුරට ඉඩ ඇත. ඉන් අනතුරුව, එය ක්‍රමයෙන් වර්ධනය වී, මැයි 12 වනදා උදෑසන සිට උතුරට බරව ඊසාන දෙසට ගමන් කර, මධ්‍යම බෙංගාල බොක්ක ආශ්‍රිතව මැයි 12 සවස් වන විට ඉතා චණ්ඩ සුළි කුණාටුවක් දක්වා තව දුරටත් වර්ධනය වීමට ඉඩ ඇත.**

**උතුරු අක්ෂාංශ 03 - 20 ත් සහ නැගෙනහිර දේශාංශ 85 - 100 ත් අතර මුහුදු ප්‍රදේශයට නැවත දැනුම්දෙන තුරු යාත්‍රා නොකරන ලෙස නාවික සහ බහුදින ධීවර ප්‍රජාවන්ට දැනුම්දෙනු ලැබේ.**

**ගාල්ල සිට මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා සහ හලාවත සිට පුත්තලම, මන්නාරම, මුලතිවු සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල ධීවර කටුයුතු වල යෙදෙන විට අවධානයෙන් කටයුතු කරන ලෙසද ඉල්ලා සිටිනු ලැබේ.**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

**වැසි තත්ත්වය:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශ වල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං නිරිත දෙසින් හමා එන අතර සුළගේ වේගය **පැ.කි.මී. (30-40)** පමණ වේ. ගාල්ල සිට මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සහ හලාවත සිට පුත්තලම, මන්නාරම, මුලතිවු සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට **පැ.කි.මී. (55-60)** දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

ගාල්ල සිට මාතර සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ සහ හලාවත සිට පුත්තලම, මන්නාරම, මුලතිවු සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ රළු වේ. දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශ තරමක් රළු වේ.

**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

### WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
### Issued at 12.00 noon on 11 May 2023

**The deep depression over the Southwest Bay of Bengal has intensified into the cyclonic storm "Mocha" and lay centered near 11.4°N and 88.0°E at 08.30 a.m. of today (11th May).** It is very likely to move north-northwestwards and gradually intensify into a severe cyclonic storm around mid-night of today, the 11th May. Thereafter, it is likely to recurve gradually, move north-northeastwards from 12th May morning and intensify further into a very severe cyclonic storm around 12 th May evening over central Bay of Bengal.

**Naval and multi-day fishing communities are advised not to venture into the sea areas bounded by (03N – 20N) and between (85E – 100E) until further notice.**

**Naval and fishing communities are requested to be vigilant while engaging in naval and fishing activities in the sea areas off the coast extending from Galle to Pottuvil via Matara and Hambantota and in the sea areas off the coast extending from Chilaw to Trincomalee via Puttalam, Mannar, Kankasanthurai and Mullaitivu.**

**Naval and fishing communities are also requested to be attentive to future forecasts issued by the Department of Meteorology in this regard.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas around the island.

**Winds:**

Winds will be south-westerly over sea area around the island and speed will be **(30-40) kmph.** Wind speed may increase up to **(55-60) kmph** at times in the sea areas off the coast extending from Galle to Pottuvil via Matara and Hambantota and in the sea areas off the coast extending from Chilaw to Trincomalee via Puttalam, Mannar, Kankasanthurai and Mullaitivu.

**State of Sea:**

The sea areas off the coast extending from Galle to Pottuvil via Matara and Hambantota and sea areas off the coast extending from Chilaw to Trincomalee via Puttalam, Mannar, Kankasanthurai and Mullaitivu will be rough. The other sea areas around the island will be fairly rough.

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි